ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන

අවසාන පරීක්ෂණය -2023/2024

STP9811 - අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම

කාලය - පැය තුන (03) යි.

දිනය : 2024.08.14 **වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

ඕනෑම ප්‍රශ්න හතරකට **(04)** පිළිතුරු සපයන්න.

01. (i.) ගුරුවරයකුට ළමා සංවර්ධන න්‍යායන්හි මූලධර්ම පිළිබඳව අවබෝධය වැදගත් වන ආකාරය හේතු **තුනක් (03)** දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී න්‍යායයේ මූලධර්මවලට අනුව **"ළමා සංවර්ධන ක්‍රියාවලිය"** සාකච්ඡා කරන්න. (ලකුණු 11)

(iii.) ළමා සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී න්‍යායයේ පැහැදිලි කිරීම් සඳහා වූ විවේචන **හතරක් (04)** පරීක්ෂා කරන්න. (ලකුණු 08)

02. (i.) ඔසුබෙල්ගේ (Ausubel) ඉගෙනුම් න්‍යායට අනුව පුද්ගලයකුගේ ඉගෙනීමට බලපාන වැදගත්ම සාධක [අවම වශයෙන් **තුනක් (03)**] පරීක්ෂා කරන්න. (ලකුණු 05)

(ii.) ඔසුබෙල්ගේ (Ausubel) ඉගෙනුම් න්‍යායේ මූලධර්මවලට අනුව අර්ථාන්විත ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම සඳහා ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි උපාය මාර්ග **හතරක් (04)** උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 12)

(iii.) අර්ථාන්විත ඉගෙනුමෙන් සිසුන්ට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක් (04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. (i.) විශ්ව - නිර්මාණවාදී පර්යාලෝකයට (universal – constructivist perspective) අනුව නවයෞවන අවධියේ ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii.) නවයොවුන් වියේදී පුද්ගලයන් මුහුණ දෙන පොදු ගැටලු **තුනක් (03)** පරීක්ෂා කරන්න. (ලකුණු 09)

(iii.) එක් එක් ගැටළුව සඳහා අවම වශයෙන් එක් උපායමාර්ගයක් දක්වමින් ඉහත සඳහන් කළ ගැටළු මඟහරවා ගැනීමට ගුරුවරයෙකුට නවයොවුන් වියේ දරුවන්ට සහාය විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 09)

04. (i.) මැල්කම් නෝල්ස්ගේ න්‍යායට අදාළව ඉගෙනීම සුසාධ්‍යකරණය කරන වැඩිහිටි අධ්‍යාපිතයන්ගේ ලක්ෂණ පහත සඳහන් අංශ තුන යටතේ සාකච්ඡා කරන්න.

(අ.) ප්‍රජානන ලක්ෂණ
(ආ.) සමාජයීය ලක්ෂණ
(ඇ.) සදාචාරාත්මක ලක්ෂණ (ලකුණු 09)

(ii.) එම න්‍යායයටම අදාළව වැඩිහිටි අධ්‍යාපිතයන්ගේ ඉගෙනීමට බාධා කරන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(iii.) වැඩිහිටි ඉගෙනුම සුසාධ්‍යකරණය කිරීමට ගුරුවරුන්ට භාවිත කළ හැකි ඵලදායී ඉගැන්වීම් උපායමාර්ග **දෙකක් (02)** උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. (i.) අභිප්‍රේරණය සිසුන්ගේ ඉගෙනීමට සහ චර්යාවන්ට බලපාන ආකාරය උදාහරණ **තුනක් (03)** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09)

(ii.) පුද්ගලයෙකුගේ පෙළඹීමට බලපාන සාධක දෙක (02) ඇට්කින්සන්ගේ (Atkinson) ජයග්‍රහණය සහ අභිප්‍රේරණය පිළිබඳ න්‍යායයට අනුව (Theory of Achievement and Motivation) උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii.) එම න්‍යායට අදාළව සිසුන් ඉගෙනීමට පෙළඹවීම සඳහා ගුරුවරුන්ට භාවිත කළ හැකි පෙළඹවීම් උපාය මාර්ග **තුනක් (03)** සාකච්ඡා කරන්න. (ලකුණු 09)

06. (i.) පුද්ගලයකුගේ තීරණයක ලක්ෂණ **හතරක් (04)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) පුද්ගලයෙකුගේ තීරණ ගැනීම පිළිබඳ පහත න්‍යායන්වල ප්‍රධාන අදහස් වෙන්කර දක්වන්න.

(අ) උපයෝගීතා න්‍යාය (Utility Theory)
(ආ) අපේක්ෂා පිළිබඳ න්‍යාය (Prospects Theory)
(ඇ) සමාජ කණ්ඩායම්වාදී ප්‍රවේශය (Social Factionist Approach) (ලකුණු 09)

(iii.) සිසුන් තුළ තීරණ ගැනීමේ කුසලතාව සංවර්ධනය කිරීම සඳහා ගුරුවන්ට භාවිත කළ හැකි උපාය මාර්ග **හතරක් (04)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

-හිමිකම් ඇවිරිණි. -